# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2072/52 - 2018 මැයි මස 25 වැනි සිකුරාදා - 2018.05.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/2011

**1963 අංක 11 දරන මුදල් පනත**

72 වන වගන්තිය යටතේ වූ නියමය

1963 අංක 11 දරන මුදල් පනතේ 71 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 72 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති දේපළ වර්ෂ දෙදහස් දහඅටක් වූ මැයි මස 25 වන දින සිට බලාත්මක වන පරිදි, 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ පිහිටුවන ලද මහජන බැංකුව වෙත මේ නියමය මගින් පවරා දෙමි.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2018 මැයි මස 25 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කලල්ගොඩ අංක : 493 ග්‍රාමසේවා වසම තුළ පිහිටි, ''කනත්තේවත්ත සහ දෙල්ගහවත්ත'' කියන ඉඩමට බී. කේ. එස්. බමුණුසිංහ බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක : 887 සහ 2007.10.13 වන දින දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන්කරන ලද කැබලි අංක : 4-1B1 දරන කොටසට මායිම් උතුරට කනත්තේවත්ත ද, නැගෙනහිරට පාර ද, දකුණට කැබලි අංක : 4-1B2 ද, බස්නාහිරට අංක : 255/303 දරන පිඹුරේ කැබලි අංක 4-1A ද මායිම් වූ පර්චස් දහය (අ : 00, රූ : 00, ප : 10) ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ පළතුරු ආදී සියලු දේත් එකී ඉඩමට යාම් ඊම් සඳහා භාවිත කරනු ලබන සියලුම මාර්ග පොදුවේ භාවිතා කිරීමේ අයිතිවාසිකමත් සමග වේ.

මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G-1657/245, 915/22 යටතේ ලියාපදිංචි වී ඇත.

06 - 553

1A - PG 4055 — 107 (2018/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*